# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2147/75 - 2019 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා - 2019.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

### අංක 06/2019 දරන සුරාබදු නිවේදනය

### ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය

සංශෝධිත (52 වන අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 8 වන සහ 30 වන වගන්ති සමග කියවිය යුතු 32 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය, මංගල සමරවීර වන මම, අංක 2128/30 දරන 2019.06.20 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 04/2019 දරන සුරාබදු නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද රීති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. 3 වන රීතිය,

    (අ) පළමු අතුරුවිධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරුවිධානය ආදේශ කිරීමෙන් :

    ''එසේම,

    (i) ආනයනකරුවකු, 2019 සැප්තැම්බර් 20 වන දිනට පෙර, සහ

    (ii) බලපත්‍රලාභී නිෂ්පාදකයකු, 2020 ජුනි 01 වන දිනට පෙර,

    දැනටමත් පවතින, II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය තොගයන් මත ස්ටිකරයක් ඇලවීමට පියවරගත යුතු ය.'' සහ

    (ආ) දෙවන අතුරුවිධානය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරුවිධානය ආදේශ කිරීමෙන් :

    ''එසේම තවදුරටත්,

    (i) ආනයනික විදේශීය මත්පැන් සම්බන්ධයෙන් වන විට, 2019 සැප්තැම්බර් මස 20 වන දිනට පෙර, සහ

    (ii) දේශීයව නිෂ්පාදිත විදේශීය මත්පැන් සහ දේශීය මත්පැන් සම්බන්ධයෙන් වන විට, 2020 ජුනි 01 වන දිනට පෙර,

    II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් ද්‍රව්‍ය තොගයන් ඇති වෙළෙන්දෙකු විසින් එකී සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ස්ටිකරයක් ඇලවීමට පියවරගත යුතු ය.''

2. 13 වන රීතියෙහි සඳහන් ''දින හැටක් (60)'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''දින දෙසිය පනස් පහක් (255)'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 4690 — 592 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*